කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# University of Kelaniya - Sri Lanka

විවෘත සහ දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2008

## Bachelor of Arts (General) Degree First Examination (External) – 2008

මානවශාස්ත්‍ර පීඨය

**Faculty of Humanities**

භාෂා පරිවර්තන ක්‍රම- TRMD 1015
Translation Methods-TRMD 1015

සිංහල/දෙමළ හා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව- TRMD 1015
**Language Competence in Sinhala/Tamil and English-1015**

පළමු කොටසින් ප්‍රශ්න තුනක් (03) ද දෙවන කොටසින් එක් ප්‍රශ්නයක් (01) ද තෝරා ගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.
Answer **four (04)** questions only choosing **three (03)** from part I and **one (1)** from part II.

ප්‍රශ්න සංඛ්‍යාව 07 යි
No. of Questions:07

කාලය: පැය තුනයි
Time: Three hours.

---

I කොටස- Part I

01. සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් භාෂාවේ පවත්නා විශේෂ ලක්ෂණ පැහැදිලි කරන්න.
Explain the special characteristic features of language as a medium of communication.

02. සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි යන එක් ව්‍යවහාරයකින් නිදසුන් සපයමින් භාෂාවක දක්නට ලැබෙන අනුපද්ධතීන් පිළිබඳ විග්‍රහයක් කරන්න.
Analyze the sub-components of a language choosing examples from Sinhala/ Tamil/ English.

03. භාෂාවක පවත්නා හැම ශබ්දයක් ම නියෝජනය කිරීමට සාම්ප්‍රදායික හෝඩිය අසමත් වන ආකාරය සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් නිදසුන් සපයමින් සාකච්ඡා කරන්න.
Discuss how the conventional orthography is unable to represent all existing sounds of a language choosing examples from Sinhala/ Tamil and English.

04. වාක්‍ය සම්පාදනයේදී වචන අතර පවත්නා ව්‍යාකරණමය සම්බන්ධතා දැක්වීමට යොදා ගන්නා ක්‍රමෝපාය කවරේ දැයි සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් නිදසුන් සපයමින් පැහැදිලි කරන්න.
Explain with suitable examples from Sinhala/ Tamil and English the techniques that are used for maintaining the grammatical relationship among words in the formation of syntactic constructions.

05. පහත දැක්වෙන මාතෘකාවලින් හතරක් (04) ගැන කෙටි ශාස්ත්‍රීය විවරණ සපයන්න.
Write brief critical notes on any four (04) of the following.

i භාෂණ සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවල ඝර්ෂ ව්‍යංජන ශබ්ද.
Fricative consonants in Sinhala/ Tamil and English.

ii සම්මත භාෂාව හා උපභාෂා.
Standard language and dialects.

iii භාෂක සමාජය.
Speech community.

iv ද්විභාෂකත්වය හා භාෂා පරිවර්තකයා.
Bilingualism and language translator.

v වාච්‍යාර්ථ හා ලක්ෂ්‍යාර්ථ.
Denotative and connotative meanings.

vi සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි භාෂාවල ස්ත්‍රීලිංග නාම පද සාධනය.
Formation of feminine nouns in Sinhala/ Tamil and English.

## II කොටස- Part II

06. (අ) පහත දැක්වෙන පාඨය සිංහලට/ දෙමළට පරිවර්තනය කරන්න.
Translate the following into Sinhala/ Tamil.

Although at the present time the few scattered groups of *Veddas* live in a state of disorganization, the older members among them seem to remember the traditional elements of the older social organization which bound the individual to the family group. There is really no scope now for the operation of the ancient social values since the remotest areas and wildest men are governed under the law and regulations obtaining throughout the land. They are subject to a common set of legal enactments and statutes without any regard being paid to the differences arising from their backwardness.

The *Veddas* themselves are ignorant of their history. They are unable to remember, nor do they boast about, their ancient social organization. They preserve no traditions about their ancestors. No genealogical records are handed down in families from father to son. They believe that after death the person joins the world of *Na-yaku* who may be well disposed towards them if they are treated well. Such a philosophy has not been conducive to the growth of a tradition nor to the preservation of records about themselves. It has been stated that the *Veddas* preserve no myths or legends which will help to record information regarding them. Nevertheless, the *Veddas* were never despised as belonging to a race of degraded men. They are not outcasts as such, nor have they been considered outcasts by the Sinhalese. On the other hand, the *Veddas* themselves were proud of their race and were never shy to

declare that they were *Veddas*. They go further and assert in all seriousness that they are even superior to the Sinhalese with whom they are reluctant to intermarry. This position is not contested even by the Sinhalese living in the neighbouring hamlets. The *Veddas*, therefore, occupy the position of aristocrats of the forest destined to pay the price of gradual extermination by their conservatism in resisting change.

(ආ) පහත දැක්වෙන පාඨය ඉංග්‍රීසියට පරිවර්තනය කරන්න.
Translate the following into English.

විජය කුමරු ලක්දිව ස්වකීය රාජධානිය පිහිටුවා ගැනීමෙන් පසු බෙහෙවින් ඉන්දියානු ජනයා ලක්දිවට සංක්‍රමණය වූහ. ඔවුන් සමග ම ඉන්දියානු අධ්‍යාපන ක්‍රම හා සංස්කෘතිය ද බමුණු ඇදුරන් ද මෙරටට පැමිණි බව නිසැක ය. විජයාවතරණයෙන් මුල් ශතවර්ෂයේ ම අධ්‍යාපන මධ්‍යස්ථාන මෙරට පහළ විය. මහාවංශයෙහි සඳහන් පණ්ඩුකාභය කුමරුගේ පුවත මේ නිගමනයට ප්‍රබල සාධකයෙකි. චිත්‍රා කුමරිය පණ්ඩුකාභය කුමරු සතුරන්ගෙන් ආරක්ෂා කරනු සඳහා ද ශාස්ත්‍රෝද්ග්‍රහණය සඳහා ද ඔහු දකුණු දෙස පණ්ඩුල නම් ගම විසූ වේදපාරගත පණ්ඩුල නම් බමුණකු වෙත යැවුවාය. පණ්ඩුල බමුණා තමාගේ පුත් චන්ද්‍ර කුමාරයාට හා පණ්ඩුකාභය කුමාරයාට ද අවශ්‍ය වූ සියලු ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීය. එකුමරු ක්‍රි.පූ. පස්වැනි ශතවර්ෂයෙහි රාජ්‍යයට පැමිණ අනුරාධපුර නගරය ගොඩ නැංවූයේ එකල පැවති උසස් ම නගර නිර්මාණ ශිල්පය අනුව ය. මේ ආදි කරුණු සලකා බලන විට එකල උසස් අධ්‍යාපන ක්‍රමයක් මෙරට තිබූ බව සිතා ගත හැකි ය.

දෙවනපෑතිස් රජුගේ රාජ්‍ය සමයෙහි දී මිහිඳු මහතෙරණුවන් බුදුසමය ලක්දිවට ගෙන ආ තැන් සිට බෞද්ධ වූ සිංහල ජනතාව බුදුදහම ඉගෙනීමට ලැදිකමක් දැක්වූ බව පෙනේ. තෙවළාදහම් ඉගැන්වීම මහමෙවුනා උයන්හි වූ මහාවිහාරයෙහි ම ආරම්භ විය. මහාවිහාරයෙහි ආරම්භ වූ ධර්මාධ්‍යාපනය ඉතා ශීඝ්‍රව පැතිරී ගියේය. ප්‍රථම වර්ෂය තුළදී ම අරිට්ඨ තෙරණුවෝ විනය පිටකය ඉගෙන දේශනා කිරීමට සමර්ථ වූහ. මහාවිහාරය අනවකාශ වූයෙන් ඉසුරුමුණි වෙස්සගිරි ආදි විහාර ද ගොඩනඟන ලදි. සිංහල භික්ෂූහු මහාවිහාරය මූලස්ථාන කොට ගෙන ධර්මාධ්‍යාපනය ආරම්භ කළහ. මහාවිහාරය වැනි බෞද්ධ ධර්මාධ්‍යාපන මධ්‍යස්ථාන ලක්දිව නානා ස්ථානයන්හි පහළ විය. දෙවන පෑතිස් රජුගේ කාලයෙහි පටන් අනුක්‍රමයෙන් වර්ධනය වූ මහා විහාරය ලක්දිව බෞද්ධ අධ්‍යාපනයෙහි මධ්‍යස්ථානය වූවා පමණක් නොව ක්‍රි.ව. 408 දී පමණ ලක්දිවට පැමිණි පාහියන් තුමා කියන පරිදි ඉන්දියාව බුරුමය ආදි බෞද්ධ රාජ්‍යයන්හි ද පතළ කීර්තිය ඇති ථෙරවාදීන්ගේ බෞද්ධ අධ්‍යාපනයෙහි මධ්‍යස්ථානය වී පැවැත්තේය.

07 (අ) පහත දැක්වෙන පාඨය සිංහලට/ දෙමළට පරිවර්තනය කරන්න.
Translate the following into Sinhala/ Tamil.

There are a lot of people who read poetry frequently and derive a great deal of pleasure from it, but there are far more who find it difficult to read and hard to understand. Indeed, it is possible to read a poem over and over again and yet still remain at a loss as to what it means. One way of overcoming such problems is to give some consideration to the question of what poetry as a whole is about. If we have a simple but clear idea of how poetry usually works and what sort of topics it normally deals with, then we should be in a better position to understand individual poems.

There are, broadly speaking, two main ways of thinking about poetry. One approach is to concentrate on the poet. Underlying this approach very often is the idea that poetry is primarily an expression of the poet's emotions. The clearest statement of this viewpoint is a comment by Wordsworth that 'poetry is the spontaneous overflow of powerful feelings'. The focus of our attention as critics in this approach is on what the poem can tell us about poet's innermost being as revealed in the work: we read the poem in order to learn about the figure behind it. Although this is a popular approach

to poetry, it is not a very practical one for the reader who is simply baffled by a poem or who cannot see what the 'feelings' are that the poet is expressing and therefore cannot appreciate them. The other shortcoming of this way of looking at poetry is that it is more concerned with the mind and personality behind the poem than with the text itself. It is, then, an unsatisfactory approach, not least because it bypasses the real problem we all experience: reading the poem and trying to understand it.

(ආ) පහත දැක්වෙන පාඨය ඉංග්‍රීසියට පරිවර්තනය කරන්න.
Translate the following into English.

මා ඉංග්‍රීසි ඉගෙනීමට ගියේ කොළඹ පන්සල පාරේ නවාතැන්පළක සිට ය. මෙතැන තව පිරිමි දහදෙනෙක් පමණ සිටියහ. මොවුන් සියලු දෙනා ම කාර්යාලීය ලිපිකරුවෝ හෝ ඉහළ පන්තිවල ඉගෙන ගත් ශිෂ්‍යයෝ වූහ. මෙය කෑම සපයන බෝඩිමක් නුවූ නිසා අපි එක් එක්කෙනා අපට රිසි අවස්ථාවල රිසි රිසි තැන්වලින් කෑම ගතිමු. නවාතැනේ අයිතිකරුවන් සිටියේ තාප්පයකින් වෙන් කරන ලද ඊට යාබද ගෙයක ය. ඒ ගෙදර රූපා නම් වූ සිහින් සිරුරක් ඇති රූමත් තරුණියක් වූවාය. ඇතැම් දිනවල ඈ දණින් දැඟුල් පමණ නැග සිටි කොට ගවුමක් ඇඳ ගේ ඉදිරිපස ගේට්ටුව අසලට වී බොහෝ වේලා පාර දෙස බලා ගෙන සිටින්නීය. ඈ වැඩිපුර ම මෙසේ පැමිණියේ නවාතැනේ වැඩිදෙනෙකු පැමිණ සිටින සවස් කාලයෙහි ය. ලිපිකරුවෝ තමන් ජීවිතය ජයග්‍රහණය කළ එක ම අය හැටියට සිතා සිටින යාන්ත්‍රික ජීවිතයෙන් බාහිර කිසිත් ඇතැ යි නොදන්නා පිරිසක් සේ පෙනී සිටියහ. වැඩ ඇරී පැමිණි පසු ඉතා කලාතුරකින් විනා බැහැරක නොගොස් කාර්යාලයේදී තමන් කළ හපන්කම් කියමින් ඔවුහු ද ගේ ඉදිරිපස ම හැසිරෙති. ඔවුන් එකිනෙකාට කියා ගන්නා පරිදි අනිකා එතන දූවටෙන්නේ රූපා සිටින බැවිනි. කෙළඹට පැමිණි මුල් දින ටිකේ සෑමදාම මා කෙළේ තැන තැන ඇවිද නගරයේ විසිතුරු නැරඹීම ය. මෙසේ දිනපතා ම බැහැර යන්නට පුරුදුව සිටිය නමුත් මට ද එහි නැවතී ඈ දෙස බලා ඉන්නට සිතෙයි.

ඔවුන්ගෙන් එකෙක් ඇතැම් දිනක රූපා තමාට ඇහෙන් ඉඟි කළ බව කියයි. තවෙකෙක් තමා සමග සිනාසුණු බව කියයි. ඈ මෙබඳු දෙයක් කරනු මා කිසි විටෙක දැක නැත. ඔවුන් කියන්නේ ඇත්තක් විය හැකි ය. බොරුවක් වුව ද විය හැකි ය. කුමක් වුවත් ඒ අසන විට මගේ හදවත තුළ හිර කර සිටින සතෙකු ඉන් මෑත් වන්නට වෙර දූන්නාක් සේ හැඟේ.

නවාතැනේ කිසිවෙකුත් නැති අවස්ථාවක ඈ ගේට්ටුව අසලට වී පාර දෙස බලා ගෙන සිටිනු මම දකිමි. මම ද කොතරම් වැදගත් වැඩක් තිබුණත් එය අත හැර මිදුලට අවුත් දූවටෙමි. දූන් දූන් ඇගෙන් ඉඟියක් ලැබේ යැයි කඩියෙකු මෙන් නලියන මනසින් යුතුව සිටින නමුත් කිසි දිනක ඈ අපේ නිවස දෙසවත් ඕනෑකමකින් යැයි හැඟෙන පරිදි නොබලයි.

******